*සැ. යු.*– 2006.09.01 වැනි දින පළ වූ අංක 1,461 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,462 - 2006 සැප්තැම්බර් 08 වැනි සිකුරාදා - 2006.09.08**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 1108 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 1113 |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 1119 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1121 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1126 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 සැප්තැම්බර් මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 සැප්තැම්බර් මස 01 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - මතුගම

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. මෙම අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2006.10.14 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කල යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිලිගැනෙන අවස්ථාවනිහි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවෙලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළයුතු අතර චෙක්පත් ආදිය බාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරුවන් ජාතික හැඳුනුම්පත ද රැගෙන ආ යුතුය.

එස්. අයි. කාලිංගවංස,
මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු,
මතුගම.

2006 අගෝස්තු මස 16 වැනි දින,
මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව(2006 වර්ෂය)

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අංක රහිත | අංක 117-6471 දරන එම්.බී. එස් වර්ගයේ හොන්ඩා යතුරු පැදිය | 1 |
| 02 | එම | අංක 113-667 දරන එම්.ඩී. 90 වර්ගයේ හොණ්ඩා යතුරු පැදිය | 1 |
| 03 | එම | එන්ජින් අංකය පමණක් ඇති අංක 92 ශ්‍රී 7993 දරන එම්.ඩී.90 වර්ගයේ හොණ්ඩා යතුරු පැදිය | 1 |
| 04 | එම | අංක 113-0704 දරන හොණ්ඩා වැලි වර්ගයේ යතුරු පැදිය | 1 |
| 05 | එම | අංක රහිත යමහා මේට් 50 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 06 | එම | අංක 96ශ්‍රී 5362 දරන හොණ්ඩා සුපර්කප් වර්ගයේ යතුරු පැදිය | 1 |
| 07 | එම | අංක 82 ශ්‍රී 177 දරන හොණ්ඩා සීඩී. 125 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 08 | එම | අංක 128-2420 දරන යමහා මේට් 50 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 09 | එම | අංක 93 ශ්‍රී 4955 දරන හොණ්ඩා සී.ඩී. 125 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 10 | එම | අංක 123-5004 යමහා ඩීටී වර්ගයේ යතුරුපැදිය | 1 |
| 11 | එම | අංක 80 ශ්‍රී 7880 දරන චැසි අංකය සහ එන්ජින් අංක රහිත හොන්ඩා සී 70 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 12 | එම | අංක 111-1538 දරන යමහා මේට් 50 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 13 | එම | අංක රහිත හොන්ඩා එම් ඩී 90 වර්ගයේ යතුරුපැදිය | 1 |
| 14 | එම | අංක රහිත හොන්ඩා සුපර්කප් වර්ගයේ යතුරුපැදිය | 1 |
| 15 | එම | අංක 153-5236 දරන හොණ්ඩා එම්.ඩී.90 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 16 | එම | අංක 122-8174 දරන යමහා 3වී ඉසෙඩ් වර්ගයේ යතුරු පැදිය | 1 |
| 17 | එම | අංක 92 ශ්‍රී 9906 හොණ්ඩා එම් ඩී වර්ගයේ යතුරු පැදි | 1 |
| 18 | එම | අංක රහිත යමහා මේඩ් 50 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 19 | එම | අංක 105-7012 දරන යමහා වර්ගයේ යතුරුපැදිය | 1 |
| 20 | එම | අංක රහිත එන්ජින් අංක හා චැසි අංක රහිත සුන්බුන් වටිනාකමක් ඇති යමහා වර්ගයේ යතුරු පැදිය | 1 |
| 21 | එම | අංක රහිත එන්ජින් අංකය පමණක් ඇති සුසුකි වර්ගයේ යතුරු පැදිය | 1 |
| 22 | එම | අංක 83 ශ්‍රී 3719 දරන හොන්ඩා බෙන්ලි වර්ගයේ යතුරුපැදිය | 1 |
| 23 | එම | අංක 93 ශ්‍රී 7599 දරන චැසි අංක රහිත හොන්ඩා සීඩී 125 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 24 | එම | අංක 114-4881 දරන හොන්ඩා සීඩී 90 වර්ගයේ යතුරු පැදිය | 1 |
| 25 | එම | අංක රහිත එන්ජින් අංක චැසි අංක නොමැති හොන්ඩා සීඩී 125 වර්ගයේ සුන්බුන් වටිනාකමක් ඇති යතුරුපැදිය | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 26 | එම | අංක 89ශ්‍රී 1265 දරන හොන්ඩා 125 වර්ගයේ යතුරු පැදිය | 01 |
| 27 | අංක රහිත | අංක රහිත යමහා ඩීටී වර්ගයේ යතුරු පැදිය | 01 |
| 28 | එම | අංක රහිත චැසි හා එන්ජින් අංක රහිත යමහා ඩිටී වර්ගයේ සුන්බුන් වටින්කමක් ඇති යතුරු පැදිය | 01 |
| 29 | එම | අංක රහිත Parlercy වර්ගයේ යතුරු පැදිය | 01 |
| 30 | එම | අංක 34 ශ්‍රී 6882 දරන චැසි හා එන්ජින් අංක රහිත මිට්සුබිෂි ඩෙලිකා වර්ගයේ සුන්බුන් වටිනාකමක් ඇති වෑන් රථය | 01 |
| 31 | එම | කොස් 75/100 දිග 1.2 එම් කැබලි | 04 |
| | | 1.4 එම් කැබලි | 13 |
| | | 1.6 එම් කැබලි | 03 |
| | | 1.8 එම් කැබලි | 30 |
| | | 2.0 එම් කැබලි | 03 |
| | | 2.1 එම් කැබලි | 08 |
| | | 2.4 එම් කැබලි | 10 |
| | | 2.6 එම් කැබලි | 05 |
| | | 3.0 එම් කැබලි | 01 |
| 32 | එම | කොස්25/100 දිග 1.0 එම් කැබලි | 03 |
| | | 1.1 එම කැබලි | 09 |
| | | 1.4 එම් කැබලි | 04 |
| | | 2.4 එම් කැබලි | 03 |
| 33 | එම | කොස් 25/175 දිග 1.2 එම් කැබලි | 20 |
| | | 1.6 එම් කැබලි | 06 |
| 34 | එම | කොස් 25/200 දිග 1.8 එම් කැබලි | 02 |
| | | 2.0 එම් කැබලි | 06 |
| 35 | එම | මිල්ල 75/100 දිග 1.2 එම් කැබලි | 02 |
| | | 1.4 එම් කැබලි | 07 |
| | | 1.8 එම් කැබලි | 08 |
| | | 2.0 එම් කැබලි | 03 |
| | | 2.2 එම් කැබලි | 02 |
| | | 2.4 එම් කැබලි | 06 |
| 36 | එම | මිල්ල 75/125 දිග 2.8 එම් කැබලි | 01 |
| 37 | එම | මිල්ල 50/100 දිග 1.4 එම් කැබලි | 01 |
| 38 | එම | මිල්ල 75/100 දිග 1.8 එම් කැබලි | 01 |
| | | 2.2 එම් කැබලි | 03 |
| | | 2.4 එම් කැබලි | 03 |
| | | 2.8 එම් කැබලි | 02 |
| 39 | එම | 75/120 දිග 2.8 එම් කැබලි | 01 |
| 40 | ඒ. ආර් 1013/06 | කියත් තලය සහිත මැෂිම | 01 |
| 41 | ඒ. ආර් 1014/06 | 1/2" වතුර මෝටර් | 01 |
| 42 | ඒ. ආර් 1076/06 | අංක රහිත පාපැදි | 01 |
| 43 | ඒ. ආර් 1077/06 | අංක එන් 222800 දරන ලුමාලා වර්ගයේ කළුපාට පාපැදි | 01 |
| 44 | ඒ. ආර් 1079/06 | වර්ගය අපැහැදිලි කළුපාට පාපැදි | 01 |
| 45 | ඒ. ආර් 1080/06 | අංක 56සී483 සී 4 ලුමාලා වර්ගයේ පාපැදි | 01 |
| 46 | ඒ. ආර් 1078/06 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 47 | ඒ. ආර් 1134/06 | අංක පී 05 24800 දරන පින්වා පාපැදි | 01 |
| 48 | ඒ. ආර් 1134/06 | අංක 113607 දරන පාපැදි | 01 |
| 49 | ඒ. ආර් 1892/05 | අංක අපැහැදිලි මවුන්ටන් වර්ගයේ පාපැදි | 01 |
| 50 | 69958 | ගෑස් ලිප් | 01 |
| 51 | 49422 | වට 03 ක් ඇති ගෑස් ලිප හා වට සහිත රෙගුලේටර් | 01 |
| 52 | ඒ. ආර් 569 | ෂෙල් ගෑස් සිලින්ඩර් | 01 |
| 53 | 63680 | අංක ඩීසීඑස් 6801-2000-59949 දරන දම්වැල් කියත් | 01 |
| 54 | 73664 | අංක (3/8072/එම්. 5/058-445.053451) මැකිටා වර්ගයේ දම්වැල් කියත් | 01 |
| 55 | 49324 | දම්වැල් කියත් | 01 |
| 56 | 44686 | අංක 267 G Super දම්වැල් කියත් | 01 |
| 57 | අංක රහිත | ඩීසීඑස් 6001-2000-58827 මැකිට වර්ගයේ දම්වැල් කියත් | 01 |
| 58 | අංක රහිත | අංක 0431645033 EFCO දම්වැල් කියත් | 01 |
| 59 | ප්‍රා. 353/06 | සවල් | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 60 | ප්‍රා. 352/06 | සවල් | 01 |
| 61 | 354/06 | සවල් | 01 |
| 62 | 334/06 | සවල් | 01 |
| 63. | 320/06 | සවල් | 01 |
| 63 | 303/06 | සවල් | 01 |
| 65 | 272/06 | සවල් | 01 |
| 66 | 224/06 | සවල් | 01 |
| 67 | 197/06 | සවල් | 01 |
| 68 | 385/05 | සවල් | 01 |
| 69 | 386/05 | සවල් | 01 |
| 70 | 335/05 | සවල් | 01 |
| 71 | 336/05 | සවල් | 01 |
| 72 | 152/05 | සවල් | 01 |
| 73 | අංක රහිත | සවල් | 08 |
| 74 | ප්‍රා. 346/06 | කුඩ | 01 |
| 75 | 356/06 | කුඩ | 01 |
| 76 | 358/06 | කුඩ | 04 |
| 77 | 355/06 | කුඩ | 04 |
| 78 | 361/06 | කුඩ | 02 |
| 79 | 343/06 | කුඩ | 01 |
| 80 | ප්‍රා 342/06 | කුඩ | 01 |
| 81 | 344/06 | කුඩ | 01 |
| 82 | 388/06 | බාල්දි | 01 |
| 83 | 389/06 | බාල්දි | 01 |
| 84 | 390/06 | බාල්දි | 01 |
| 85 | 391/06 | බාල්දි | 01 |
| 86 | 392/06 | බාල්දි | 01 |
| 87 | 359/06 | බාල්දි | 01 |
| 88 | 360/06 | බාල්දි | 01 |
| 89 | 357/06 | බාල්දි | 01 |
| 90 | 345/06 | බාල්දි | 01 |
| 91 | 351/06 | බාල්දි | 01 |
| 92 | 337/06 | බාල්දි | 01 |
| 93 | 333/06 | බාල්දි | 01 |
| 94 | 326/06 | බාල්දි | 01 |
| 95 | 321/06 | බාල්දි | 01 |
| 96 | 319/06 | බාල්දි | 01 |
| 97 | 223/06 | බාල්දි | 01 |
| 98 | 220/06 | බාල්දි | 01 |
| 99 | 196/06 | බාල්දි | 01 |
| 100 | 182/06 | බාල්දි | 01 |

09-289

---

## දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - තංගල්ල

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

තංගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ මෙතෙක් හිමිකම් නොකියන ලද විකුණා මුදල් රජයට බැර කිරීමට නියමිතව ඇති පහත සඳහන් ද්‍රව්‍ය 2006.10.07 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයා ගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට ප්‍රථම වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවෙලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගන්නා පුද්ගලයන් තම ජාතික හැඳුනුම්පත් අනිවාර්යයෙන්ම රැගෙන පැමිණිය යුතුය.

තාමර තෙන්නකෝන්,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
තංගල්ල.

2006 අගෝස්තු මස 15 වැනි දින,
තංගල්ල, දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### භාණ්ඩ පිළිබඳ විස්තරය

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | ඒ.ආර්. 137/02 | අංක 22511 දරන එවොන් වර්ගයේ පාපැදිය | 01 |
| 02 | ඒ. ආර්. 488/03 | මවුන්ටන් වර්ගයේ අංකය අපැහැදිලි පා පැදිය | 01 |
| 03 | එම | මවුන්ටන් වර්ගයේ අංකය අපැහැදිලි පා පැදිය | 01 |
| 04 | එම | මවුන්ටන් වර්ගයේ අංකය අපැහැදිලි රතු පාට පා පැදිය | 01 |
| 05 | එම | කලු පැහැති ස්ටැන්ඩඩ් වර්ගයේ අංකය අපැහැදිලි පාපැදිය | 01 |
| 06 | එම | අංකය හා වර්ගය නොදන්නා අබලන් පාපැදිය | 01 |
| 07 | ඒ. ආර්. 528/03 | හීරෝ වර්ගයේ අංකය අපැහැදිලි පාපැදිය | 01 |
| 08 | ඒ. ආර්. 450/03 | එස්. පී ආර් 24287 දරන සිංගර් වර්ගයේ පාපැදි | 01 |
| 09 | ඒ. ආර්. 451/03 | අංක කේ. ඒ. අයි. 02129 දරන ලුමාලා වර්ගයේ පාපැදි | 01 |
| 10 | ඒ. ආර්. 249/04 | අංකය සූරා ඇති නිල් පාට මවුන්ටන් වර්ගයේ පාපැදිය | 01 |
| 11 | ඒ. ආර්. 265/04 | අංක එස්. ජී. ආර්. 09961 දරන සිංගර් ස්පෝර්ට් වර්ගයේ පාපැදිය | 01 |
| 12 | ඒ. ආර්. 527/03 | මොඩල් අංක සී 708 දරන චීනයේ නිෂ්පාදිත පරිඝණක මොනිටර් එකයි (අබලන්) | 01 |
| 13 | ඒ. ආර්. 537/04 | ඉරිදා පුවත්පත් 90 ක් සහිත පාර්සලය | |
| 14 | ඒ. ආර්. 536/04 | එෆ්ජ් එක්ස් 1110 බී දරන සුදුපාට හා නිල්පාට දුරකථන පෙට්ටි | 01 |
| 15 | ඒ. ආර්. 539/03 | ව්‍යායාම උපකරණ | 03 |
| 16 | ඒ. ආර්. 386/03 | අබලන්වූ 3 ¼ x 2 x 2½ ප්‍රමාණයේ සිංගර් වර්ගයේ අධි ශීතකරණ | 01 |
| 17 | එම | අබලන් වූ අඩි 1.10 x 1.11 x 2.8 ප්‍රමාණයේ ට්‍රොපිකල් වර්ගයේ අධිශීතකරණ | 01 |
| 18 | එම | අබලන් වූ වායුසමීකරණ | 01 |
| 19 | ඒ. ආර්. 547/04 | හොන්ඩා එච්. බී. 5 වර්ගයේ යතුරු පැදියක කොටස් | - |
| 20 | ඒ. ආර්. 378/03 | හොන්ඩා චැලි වර්ගයේ රතුපාට යතුරුපැදියක කොටස් | 01 |
| 21 | ඒ. ආර්. 415/03 | දැල්පීස් 20 ක් පමණ වූ මාළු දැල් | 01 |
| 22 | 78042 | යකඩ තාච්චි | 01 |
| 23 | 78050 | යකඩ තාච්චි | 01 |
| 24 | 77984 | පඩි තුනක් සහිත තරාදි | 01 |
| 25 | 80889 | 1. සවල් | 01 |
| | | 2. පනිට්ටු | 01 |
| 26. | 79000 | අත්කියත් | 01 |
| 27. | 70568 | විසිදැල් | 01 |
| 28. | 75566 | 1. යතුකැට | 01 |
| | | 11. අත්කියත් | 01 |
| 29. | 85062 | 1. කුඩා අත්පොරව | 01 |
| | | 11. සිහින් කම්බි අඩි 70 ක් පමණ | |
| 30. | 86353 | පැට්‍රෝමැක්ස් ලාම්පු | 01 |
| 31. | 88315 | පැට්‍රෝමැක්ස් ලාම්පු | 01 |
| 32. | 80175 | අංක එස් පී එච් වී 2806 දරන යන්මාර් වර්ගයේ අත්ට්‍රැක්ටර් (ට්‍රේලරය සහිත) චැසි අංකය වයි සී 70-516376 එන්ජින් අංක එස් එස් 70-801472 | 01 |
| 33. | 88639 | කඩොල් දැව කෝටු | 70 |
| 34. | 80219 | i. අංක එස් ඒ අයි එච් එල් 021 දරන ගස් කපන මැෂිම | |
| | | ii. සුදුපාට කැන් එකයි | |
| | | iii. කලු ඉරි ටී ෂර්ට් එකක් හා කොලපාට බෑගය | |
| | | iv. අඩි 3 1/2 ක් දිග අලවංගුව | |
| | | v. අත්පොරව | |

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 35. | 80220 | i. අංක 941129 දරන ගස් කපන මැෂිම | |
| | | ii. නිල්පාට ප්ලාස්ටික් කෑනය | |
| | | iii. ලාකොල පාට සරම | |
| | | iv. රතුපාට අත් දිග කමිසය | |
| | | v. ලා නිල් පාට අත් දිග කමිසය | |
| | | vi. රෝස පාට කමිසය | |
| 36. | 81629 | හිරිගල් තොගයක් | |
| 37. | අංක රහිත | විවිධ වර්ණයේ හා විවිධ ප්‍රමානයේ ප්ලාස්ටික් හිස් බූලි හා කෑන් තොගයක් | |
| 38. | අංක රහිත | හිස් බෝතල් තොගයක් | |
| 39. | අංක රහිත | ප්ලාස්ටික් බීම අසුරණ කිහිපයක් | |
| 40. | | කාර්යාල භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ | |
| | | i. අබලන් පා පැදි | 02 |
| | | ii. මුදල් පෙට්ටි | 02 |
| | | iii. රබර් හෝස් පයිප්ප | 01 |
| | | iv. වානේ කැබිනෙට්ටු | 02 |
| | | v. වානේ අල්මාරි | 02 |
| | | vi. වීල් බැරෝ | 01 |

09-288

---

## පොලිස් අධිකාරී කොට්ඨාශය-පාර්ලිමේන්තුව

### පොලිස් දෙපාර්තමේන්තුවේ අබලි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පාර්ලිමේන්තුව පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථානයේ පාවිච්චි කරන ලද මෙම *ගැසට් පත්‍රයේ* පළ වී ඇති පහත සඳහන් අබලි භාණ්ඩ 2006.09.23 වැනි දින පාර්ලිමේන්තුව පොලිස් ස්ථානයේ මයික්කෝ හට නිවාස භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙම වෙන්දේසියේ භාණ්ඩ 2006.09.22 වැනි දින වෙන්දේසි භූමියේදී පෙරවරු 09.00 සිට පස්වරු 04.00 දක්වා පරීක්ෂා කිරීමට හැකි බව දන්වමි.

03. වෙන්දේසියේ මිළ දී ගන්නා භාණ්ඩ එදිනම වෙන්දේසි භූමියේදී මුදල් ගෙවා රිසිට් පත් ලබා ගෙන වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතු බව දන්වා සිටිමි.

04. වෙන්දේසිය පවත්වන ලද දිනය 2006.09.23 පෙරවරු 09.00 සිට පස්වරු 04.00 දක්වා වේ.

කේ. එම්. එල්. සරත්චන්ද්‍ර,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
පාර්ලිමේන්තුව.

| | *වෙළඳ නාමය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01. | ෆැක්ස් යන්ත්‍රය දුරකථනය සමග | 01 |
| 02. | විදුලි කේතල් | 05 |
| 03. | යතුරු පැදි හිස් වැසුම් | 06 |
| 04. | මෙගාෆ් ෆෝන් | 01 |
| 05. | මල්ටිෆෝන් | 05 |
| 06. | ඇළුමිනියම් කේතල් | 02 |
| 07. | පෙට්රල් ලාම්පු | 01 |
| 08. | වතුර පිල්ටර් | 07 |
| 09. | වීල් බැරෝ | 01 |
| 10. | කල්දේරම් (කුඩා) | 05 |
| 11. | කල්දේරම් (අහල් 18) | 08 |
| 12. | කල්දේරම් (අහල් 24) | 10 |
| 13. | ගෑස් ලිප් | 05 |
| 14. | කෑම මේස පුටු (ෆෝමිකා) | 11 |
| 15. | ප්ලාස්ටික් පුටු | 05 |
| 16. | වානේ පුටු | 15 |
| 17. | ඉබි යතුරු | 02 |
| 18. | කැරම් බෝඩ් | 04 |

09-339

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

මගේ අංකය ජා/1/1/7/02.

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ජා-ඇල

### 2007 ජනවාරි මස 01 දින සිට 2007 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යකලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උප ලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි "අංක ................ දරන ................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත ලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2006.09.26 දින පෙ. ව. 10.30 ට පෙර ජාඇල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. *නැතහොත්* එම වේලාවට පෙර ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2006.09.26 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියළුම ටෙන්ඩර්කරුවන් ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2006.10.25 දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩබ්. ඒ. ඩබ්. ප්‍රේමප්‍රිය,
ප්‍රාදේශීය ලේකම් – ජාඇල.

2006 අගෝස්තු මස 16 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
ජා-ඇල.

#### උපලේඛනය

| *කොට්ඨාශය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රුපියල්)* |
|---|---|---|---|
| ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | කඳාන | 2006.09.26 පෙ. ව. 10.30 | 1,500 |
| එම | වැලිගම්පිටිය | එම | 1,500 |
| එම | කනුවන | එම | 4,000 |
| එම | ඒකල මෙගොඩ | එම | 5,000 |
| එම | දඩුගම | එම | 1,000 |

09-352

---

## ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාශය- බේරුවල

### 2007 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කල 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තළදී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරා බදු කොන්දේසි වලටත් යටත්ව 2007 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා බේරුවල ප්‍රාදේශීය ලේකම් තැන වන මා විසින් 2006 සැප්තැම්බර් 18 වන දින පෙරවරු 10.30 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නිසි ආකෘති පත්‍රය සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබා ගත් කුවිතාන්සියක් ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍ර දේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබා ගත් ටෙන්ඩරකරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

*i.* ටෙන්ඩර් පත්‍ර මුළුමණින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේදී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතුය ;

*ii.* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ෆෝරම්වල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතුය ;

*iii.* සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතුය.
මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරනු ලබන ටෙන්ඩර් පත්‍ර

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සිය ; සහ

*(ආ)* වත්කම් සහතිකයක් ;

සමග ලියුම් කවරයක බහා මුද්‍රා තැබූ ලියුම් කවරයෙහි වම් කෙළවර මුදුනේ තැබෑරුම් අංකය හා නම සඳහන් කර බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම තැන්පත් කළ යුතුය.

එසේ ටෙන්ඩර් භාර ගන්නා වේලාව ඉකුත්වීමට ප්‍රථමයෙන් බේරුවල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. එසේ නැතහොත් එක් රේන්දයක් වෙනුවෙන් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හිදී සියළුම ටෙන්ඩර්කරුවන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කල අය වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 2.30 ට පෙර බේරුවල ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යටකී රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතුය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම් සඳහා යි ලකුණු කර චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නැමති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතුය.

06. පූර්වෝක්ත දිනයේදී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද නැවත විකිණීම 2006.10.17 වැනි දින පෙරවරු 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුයි.

07. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකියි.

යූ. ඩී. සී. ජයලාල්,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2006 ක් වූ අගෝස්තු මස 23 වැනි දින,
බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාශය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *නැවත විකුණන වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01. | බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | අළුත්ගම උපකාර්යාලයේ සීමාව තුල | පෙ. ව. 11.00 පස්වරු 5.00 | පස්වරු 2.00 සහ රාත්‍රී 8.00 | රු. 2000/- | 2006 සැප්තැම්බර් 18 වැනි දින පෙරවරු 10.30 දක්වා | 2006 ඔක්තෝබර් 17 වැනි දින පෙරවරු 10.30 දක්වා |

*සැලකිය යුතුයි-* 2007 වර්ෂයට දැනට රා තැබෑරුම පිහිටා ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුම විවෘත කරන්නේ නම්, ඒ සම්බන්ධයෙන් බේරුවල ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

09-353

## වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

### 2007 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* පළ කර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි වලටත් එම කාලය තුළදී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසි වලටත් යටත්ව 2007 වර්ෂය තුළදී පහත සඳහන් උප ලේඛනයන්හි දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිළදී ගැනීම සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් 2006 සැප්තැම්බර් මස 19 වැනි දින පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (අ)සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි ආකෘති පත්‍රයේ නියමිත ටෙන්ඩර් පෝර්ම විය යුතුය.

*(ආ)* ඇප මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයක පහත උපලේඛනයෙහි දැක්වෙන පරිදි ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සිය ; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදි නිශ්චල දේපළ පිහිටි ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් හා වත්කම් පිළිබඳ සහතිකය ඉදිරිපත් කිරීම පිළිබඳව යථොක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ ;

*(ඇ)* ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි සැලකිලිමත් විය යුතුය.

*(i)* ටෙන්ඩර් පත්‍රය මුලුමනින් ම සම්පූර්ණ කළ යුතුය. එහි සඳහන් කරන ගණන්, ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය.

*(ii)* සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පතේ අංකය ද යෙදිය යුතුය.

*(iii)* සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතුය.

*(iv)* සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිළ කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීම සඳහා නියමිත වේලාව ඉකුත් වීමට පෙර වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එහි සඳහන් වේලාවට ටෙන්ඩර්කරුවන් වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින ප. ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් නමින් තිල්දණ්ඩාහින්න මහජන බැංකුවේ ඇති ගිණුමට බැර වන සේ මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

07. පොරොන්දුවන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩර් පතක් කිහිපදෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුණහොත් ඒවා 2006.10.17 වැනි දින පෙ. ව. 10.00ට මෙම ස්ථානයේදී නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

කේ. එන්. සුනන්ද පියසිරි,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2006 අගෝස්තු මස 17 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

*රා තැබෑරුම්*

| *අනු අංකය* | *රා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිට විය යුතු ස්ථානය* | *ටෙන්ඩර්භාර ගැනීම අවසන් කළ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01. | හරස්බැද්ද | හරස්බැද්ද ග්‍රාමය තුළ | පෙ. ව. 10.00 ට | 1,500.00 |
| 02. | පදියපැලැල්ල | පදියපැලැල්ල ග්‍රාමය තුළ | පෙ. ව. 10.00 ට | 1,000.00 |

09-340

## 2007 වර්ෂය සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

2007 ජනවාරි 01 සිට 2007 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රා තැබෑරුමෙහි පැසුනු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිලදී ගැනීම සඳහා, 1982 අගෝස්තු මස 20 වෙනි දින නිකුත් කරන ලද අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පල කරන ලද, රා විකිණීමේ කොන්දේසිවලට ද, දැනට බල පවත්නා සුරාබදු කොන්දේසි වලට හා පහත සඳහන් කොන්දේසි වලට ද යටත්ව 2006 ඔක්තෝම්බර් මස 03 වන දින පෙ.ව. 10.30 දක්වා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

02. රා රේන්ද මිලදී ගැනීමට ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර, මෙහි පහත දැක්වෙන ටෙන්ඩර් උපලේඛනයෙන් නියම කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප් ශාඛාවකින් ලබාගත් කුවිතාන්සියක් ද, ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා, එයට මුද්‍රා තබා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම ද, පැහැදිලිව, උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්වීමට හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2006.10.03 වෙනි දින පෙ. ව. 10.30ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසිම කරුණු දැන්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යයි ප්‍රකශායට පත් කිරීමෙන් පසු, සාර්ථක ටෙන්ඩර්කරුවෙකු විසින් එසේ ප්‍රකාශ කළ දින ප.ව. 2.00 ට පෙර පන්නල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරුණු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසි වලට අත්සන් කළ යුතුයි.

07. 2007 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2007 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම්, ඒ වෙනුවට තෝරාගත් අළුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රධානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත යුතුයි.

08. 2006.10.30 දින රේන්ද විකිණීමේ දී සතුටුදායක ඉල්ලීම් නොලැබුනහොත් 2006.11.03 දින පෙ.ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මෙම කාර්යාලයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩබ්. එම්. දීප්ති ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්/පන්නල.

2006 අගෝස්තු මස 22 වැනි දින,
පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

### *උපලේඛනය*

පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම - 2007 වර්ෂය

| *අංකය හා නම* | *පත්තුව* | *තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය* | *ටෙන්ඩර් තැන්පත් මුදල* | *ටෙන්ඩර් වසන දිනය හා වේලාව* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| 01. ගිරිඋල්ල | කටුගම්පල හත්පත්තුව | මාහරගම/හාල්පනේ ගම තුළ (අංක 1566 මාහරගම ග්‍රාම නිළධාරි වසම) | රු. 1000.00 | 2006.10.03 පෙ.ව. 10.30 | පෙ.ව.11.00 සහ ප.ව. 5.00 | ප.ව.2.00 ප.ව. 8.00 |

09-431

## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය-කොළඹ

### 2007 වර්ෂය සඳහා රා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම්වල 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

02. කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත පෙනෙන ඒජ් තිරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය. ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන්වීමට පෙර, වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතුය.

03. සීල් තබන ලද කවරයක බහාලූ එක් එක් ටෙන්ඩර්පත ඇතුළත් කවරයේ උඩ වම් පස කෙළවරේ "අංක ............ දරන රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය – කොළඹ" යනුවෙන් සඳහන් කර (අ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපෑලෙන් කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් උපලේඛනයේ ඒ ඒ තැබෑරුමට කෙළින් දක්වා ඇති වේලාවන් සහ දිනයන්හි දී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාවේ දී කාර්යාලයට පැමිණ සිටිය යුතුය.

04. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර, වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතුය.

05. මිළයට ගන්නා හැටියට වරප්‍රසාද ලැබූ යම් ටෙන්ඩර්කරුවෙක් විකිණීම පිළිබඳ කොන්දේසිවලට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් හෝ උවමනා කරන ඇප මුදල නියමිත අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වීමෙන් ඔහු විසින් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර, ටෙන්ඩර්කරුවෙක් වශයෙන් ඔහුගේ නම සුරාබදු බලපත්‍ර සම්බන්ධ වදරකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද පුලුවන. මෙයට විශේෂයක් වශයෙන් සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින්, විකිණීම සම්බන්ධ කොන්දේසි අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන් විසින් තැන්පත් මුදල ආපසු දීම සහ ඉහත සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් තබන ලද ඇපය ආපසු ගෙවනු ලැබේ.

06. 2006 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේ දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාශය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැළකිය යුතුය.

07. කිසි කරුණක් නොදක්වාම එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

08. අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :

### උපලේඛනය

| *(ඒ)* *අනුක්‍රමික අංකය* | *(බී)* *ප්‍රදේශය* | *(සී)* *ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* | *(ඩී)* *තැබෑරුම විවෘත කරන වේලාව* | *(ඊ)* *තැබෑරුම වසන වේලාව* | *(එෆ්)* *ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු.* | *(ජී)* *ටෙන්ඩරය භාරගන්නා අවසාන වේලාව* | *(එච්)* *විකිණීම කරන දිනය* |
|---|---|---|---|---|---|---|---|
| 1. | අංක 5 කොට්ඨාශය කොටහේන බටහිරට (කොටබෝම්) | *පෙදෙස මෙසේ සීමා වී තිබේ.–* උතුරට ස්කිනර් පාරේ දකුණු පෙදෙසේ සන්ධියේ සිට කොටබෝම් වීදියේ සන්ධියට සහ ලැස්කැරින් වීදියේ සන්ධිය දක්වාත්ය, නැගෙනහිරට ලැස්කැරින් වීදියේ සිට බටහිර පැත්ත ස්කිනර් පාරේ (දකුණු) සන්ධියේ සිට පෙදෙස හා | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 | 5,000 | පෙ. ව. 10.30 | 2006.09.21 |

| (ඒ) අනුක්‍රමික අංකය | (බී) ප්‍රදේශය | (සී) ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | (ඩී) තැබෑරුම විවෘත කරන වේලාව | (ඊ) තැබෑරුම වසන වේලාව | (එෆ්) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | (ජී) ටෙන්ඩරය භාරගන්නා අවසාන වේලාව | (එච්) විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| | | ජම්පටා වීදිය, දකුණට එහි සන්ධියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස කොටබෝම් වීදිය සහ ලැස්කැරින් වීදියේ සන්ධිය දක්වා පෙදෙස සහ බටහිරට එකී සන්ධියේ සිට කොටබෝම් වීදියේ නැගෙනහිර පෙදෙස ජම්පටා වීදියේ සන්ධියේ සිට ස්කිනර් පාර (උතුරට) සන්ධිය දක්වා වූ පෙදෙසත්ය. | | | | | |
| 02. | අංක 5 කොට්ඨාශය කොටහේන බටහිර | එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ උතුරු පෙදෙස පිකරින් පාරේ සහ කොටහේන වීදියේ සන්ධිය දක්වා වූ පෙදෙස | එම | එම | එම | එම | එම |
| 03. | (ස්කිනර් පාර) අංක 2 කොට්ඨාශය මෝදර | (ඒ) ඉහල වීදියේ ප්‍රදේශය ඇන්ඩෲ පෙදෙසේ සන්ධිය දක්වා අලුත් මාවත පාර සහ ශාන්ත ඇන්ඩෲ පාරේ සන්ධිය දක්වා<br>(බී) ශාන්ත ඇන්ඩෲ පාර පෙදෙසේ සන්ධිය දක්වා ඉහල ශාන්ත ඇන්ඩෲ පෙදෙසේ සහ මාෂන් වීදියේ සන්ධිය දක්වා<br>(සී) මෝදර වීදියේ ප්‍රදේශ සහ එහි සන්ධිය දක්වා මාෂන් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 | 5,000 | පෙ. ව. 10.30 | 2006.09.21 |
| | | (ඩී) ශාන්ත ජේම්ස් වීදියේ දෙපස එහි සන්ධි දක්වා, මෝදර වීදියේ සහ අලුත් මාවත පාරේ සන්ධිය දක්වා | එම | එම | එම | එම | එම |
| | | (ඊ) අලුත් මාවත පාරේ දෙපස සහ එහි සන්ධිය දක්වා, එහි පටුමග සහ පහළ ශාන්ත ඇන්ඩෲ පෙදෙසේ සන්ධිය දක්වාත්ය. | | | | | |
| 04. | අංක 3 කොට්ඨාශය මාදම්පිටිය (පර්ගියූෂන්) පාර) | *ප්‍රදේශය මෙසේ සීමා වී තිබේ.*<br>උතුරට පර්ගියූෂන් පාර, දකුණ පෙදෙසේ සිට සන්ධිය දක්වා සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ ගහ දක්වා, නැගෙනහිරට ලූකස් පාරේ බටහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියූෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා, දකුණට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා ලූකස් පාරේ සන්ධිය දක්වා, බටහිරට දානියෙල් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ ගිනමුල්ල පටුමගේ සන්ධිය දක්වාත්ය. | එම | එම | එම | එම | එම |
| 05. | අංක 3 කොට්ඨාශය මාදම්පිටිය | *ප්‍රදේශය මෙසේ සීමා වී තිබේ.*<br>උතුරට පර්ගියූෂන් පාරේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා, ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්ධිය දක්වා, නැගෙනහිරට නාගලගම් වීදියේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා, පර්ගියූෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා, දකුණට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්ධිය දක්වා නාගලගම් වීදියේ සහ ලූකස් පාරේ සන්ධිය දක්වා බටහිරට ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා, මාදම්පිටිය පාරේ සහ පර්ගියූෂන් පාරේ සන්ධිය දක්වාත්ය. | එම | එම | එම | එම | එම |

09. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

10. *වැදගත්*.– 2006.09.21 වැනි දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද 2006.10.19 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

කාන්ති පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2006 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

9-310/1

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

අහංගම ගොවියාපාන, 'සාමය' හි පදිංචි දම්මලගේ පියසිරි වන මම ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරියේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත්වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

ද. පියසිරි.

2006 ක් වූ අගෝස්තු මස 23 වැනි දින,
ද පියසිරි
'සාමය',
ගොවියාපාන,
අහංගමදිය.

09-344

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බස්නාහිර පළාතේ හේනේගම, නාකඳපොළ පදිංචි ජයසිංහ ආරච්චිගේ චන්ද්‍රලතා ජයසිංහ වන මා විසින් අත්සන් කරන ලද, ප්‍රසිද්ධ නොතාරිස් (ගම්පහ) තිස්ස වික්‍රමාරච්චි කරුණාරත්න විසින් 1981 සැප්තැම්බර් මස 02 වෙනි දින සහතික කරන ලද අංක 3286 දරන ඇටර්නි බලපත්‍රය මගින් බ. ප. හේනේගම, නාකඳපොළ පදිංචි ජයසිංහ ආරච්චිගේ රූපිකා තුරංගනී ජයසිංහ වෙත දෙන ලද ඇටර්නි බලපත්‍රය සහ එහි සඳහන් සියලුම බලය අවලංගු කොට, බලරහිත කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයටත් සියලු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ජයසිංහ ආරච්චිගේ චන්ද්‍රලතා ජයසිංහ.

2006 අගෝස්තු මස 25 වැනි දින.

09-417

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැනුම් දීම

පොතුහැර මහපිටිය විමල නිවසෙහි පදිංචි ඉරුගල් බණ්ඩාරලාගේ විමලවංසසූර්ය වන මම කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුල්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරය වන නොතාරිස් ආඥා පනතේ 07 වැනි වගන්තියේ ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

අයි . බී. විමලවංසසූර්ය.

2006 අගෝස්තු මස 21 වැනි දින,
'විමල නිවස',
මහපිටිය,
පොතුහැර.

09-294

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

අවිස්සාවේල්ල, හොනිටන් පෙදෙස, මන්සූරියා පටුමහ, අංක 21 දරන තැන පදිංචි උස්වත්ත ලියනගේ ලියෝරිස් පෙරේරා වන මම කොළඹ දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරියේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත්වූ පසු රෙජිස්ට්‍රාර් ජෙනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

යූ. එල්. එල්. පෙරේරා.

2006ක් වූ අගෝස්තු මස 22 වැනි දින,
අංක 21, මන්සූරියා පටුමග,
හොනිටන් පෙදෙස,
අවිස්සාවේල්ල.

09-302

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

ගාල්ල, අම්බලන්වත්ත, මවුන්ටන්හෝල් වත්ත "සඳනුවන්" හි පදිංචි ඥානා කොට්ටව ගමගේ වන මම ගාල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු වශයෙන් ඇතුලත්වීම සඳහා නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාට මෙයින් දන්වා සිටිමි.

ඥානා කොට්ටව ගමගේ.

2006 අගෝස්තු මස 22 වැනි දින,
"සඳනුවන්",
මවුන්ටන් හෝල්වත්ත,
අම්බලන්වත්ත,
ගාල්ල.

09-304

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

ගාල්ල, අම්බලන්වත්ත, මවුන්ටන්හෝල් වත්ත "සඳනුවන්" හි පදිංචි චන්ද්‍රසෝම කොට්ටව ගමගේ වන මම ගාල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු වශයෙන් ඇතුලත්වීම සඳහා නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාට මෙයින් දන්වා සිටිමි.

සී. කේ. ගමගේ.

2006 අගෝස්තු මස 22 වැනි දින,
"සඳනුවන්",
721/ඩී මවුන්ටන් හෝල්වත්ත,
අම්බලන්වත්ත,
ගාල්ල.

09-303

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

